**ශීර්ෂය 110 - අධිකරණ අමාත්‍යාංශය**

----------------------------------------

**1. මූල්‍ය ප්‍රකාශන**

-----------------------

**1.1 තත්ත්වාගණනය කළ මතය**

-----------------------------

අධිකරණ අමාත්‍යාංශයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2022 ජුනි 17 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2022 ජුලි 21 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට අධිකරණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

--------------------------------------------

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම**

---------------------------------------------------------------------

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

---

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

**(අ)** මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

**(ආ)** ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

#### (අ) මූලධන වියදම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ප්‍රාග්ධන වැය විෂයයකට විදේශීය ප්‍රදාන මඟින් සලසා ගෙන තිබුණු ප්‍රතිපාදනවලින් භාණ්ඩාගාරය මඟින් රු. මිලියන 2.768 ක වියදමක් දරා තිබුණද, එය භාණ්ඩාගාර මුද්‍රිත සටහන් මගින් හෝ වර්ෂයේ වියදම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි. එහෙත් එම වැය විෂයයට භාණ්ඩාගාරය මඟින් සටහන් කර තිබූ රු.3,540 ක අධිභාරය මූල්‍ය ප්‍රකාශනවල මූලධන වියදම්වලින් අඩුකර දක්වා තිබුණි. | **GIZ** ව්‍යාපෘතිය මගින් සෘජුව මිළ දී ගෙන අමාත්‍යාංශය වෙත ලබා දී ඇති **Laptop** පරිගණක මෙම වර්ෂයේ ස්ථාවර වත්කම් ලෙස ගිණුම් ගත කිරීමට කටයුතු කරනු ලැබේ. | සියලු වියදම් ගිණුම්ගත කලයුතු අතර දෙපාර්තමේන්තු පොත්, භාණ්ඩාගාර සටහන් සමඟ පරීක්ෂා කර බලා සටහන් නිවැරදි කර ගත යුතු වේ. |

#### (ආ) මූල්‍ය නොවන වත්කම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය තුල ගෘහ භාණ්ඩ හා කාර්යාලීය උපකරණ වැය විෂයට වෙනත් වැය ශීර්ෂ මඟින් ගිණුම්ගත කර තිබූ රු.344,544 ක වියදම සහ වැය විෂයයන් 02 කින් මිල දී ගෙන තිබුණු එකතුව රු.22,825,665 ක් වූ කාර්යාල උපකරණ වටිනාකම ප්‍රාග්ධනිත කර නොතිබුණි. | සිගාස් වැඩසටහනෙහි මෙම වැය විෂයන් යටතේ මිළදී ගන්නා උපකරණ ස්ථාවර වත්කම් ලෙස ප්‍රාග්ධනිත කිරීමේ හැකියාවක් නොමැත.එබැවින් එම උපකරණ පවතින ස්ථාන නිවැරදිව හඳුනා ගැනීමෙන් අනතුරුව මූල්‍ය නොවන වත්කම් ආරම්භක ශේෂ ලෙස ගිණුම් ගත කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | සියළු වත්කම් මිලදී ගැනීම් නිවැරදිව ප්‍රාග්ධනිත කල යුතු වේ. |

**1.6.2 ලේඛණ විධිමත්ව පවත්වා නොතිබීම**

පහත දැක්වෙන ලේඛණ විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| විගණන නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| ලේඛණ වර්ගය | අදාල රෙගුලාසිය | නිරීක්ෂණ | | |
| (අ)ඇප ලේඛණය | මුදල් රෙගුලාසි 891 | පවත්වා නොතිබුණි. | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන ඇප තැන්පත් කිරීමටත්, ඇප ලේඛණය පිළියෙල කිරීමටත් කටයුතු කරන ලෙස අදාල නිලධාරීන් දැනුවත් කරන ලදී. | ඇප තැබිය යුතු නිලධාරීන් හඳුනා ගෙන මුදල් රෙගුලාසි 891 ප්‍රකාරව ඇප ලේඛණය පවත්වා ගත යුතු වේ. |
| (ආ)හානි පිළිබඳ ලේඛණය | මුදල් රෙගුලාසි 110 | යාවත්කාලීන කර නොතිබුණි. | 2021 වර්ෂයේ සිදුව ඇති රිය අනතුරු 15 ක තොරතුරු ඇතුළත් කරමින් හානි හා පාඩු ලේඛනය යාවත් කාලීන කිරීමට කටයුතු කර ඇත. | පවත්වාගෙන යනු ලබන හානි පිළිබඳ ලේඛණයට සියළුම අලාභ හානි ඇතුලත් කල යුතු වේ. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වැය විෂයය විස්තර 41 ක් සඳහා සලසා ගෙන තිබුණු ශුද්ධ ප්‍රතිපාදන රු.355,502,000 ක් සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිලධාරීන් රාජකාරීයට කැඳවීම සීමා කිරීම, ඒ මඟින් යන්ත්‍ර හා යන්ත්‍රෝපකරණ භාවිතය අවම වීම, විදේශ ගමන් සීමා කිරීම, අපේක්ෂා කල පරිදි වියදම් ඇති නොවීම නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව සැලසුම් කල පරිදි වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම යන කරුණු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව ඇස්තමේන්තු සකස් කරන බැවින් පුරෝකථනය කරන ලද ක්‍රියාකාරී සැලැස්මේ ඇතුලත් කාර්යයන් අදාල කාලය තුල ඉටු කිරීමට කටයුතු කල යුතු වේ. |

(ආ) ඉහත "අ" හි සඳහන් ප්‍රතිපාදන ඉතිරිවීම් සම්බන්ධයෙන් වැඩිදුරටත් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

| | | |
|---|---|---|
| **i.** අන්තර් ජාතික සංවර්ධනය පිළිබඳ ජාත්‍යන්තර නියෝජිතායතනයේ සමාජ සහජීවන හා ප්‍රතිසන්ධාන ක්‍රියාකාරකම් ව්‍යාපෘති සඳහා විදේශීය ප්‍රදාන මගින් රු.1,000,000 ක් සහ විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය යටතේ රු.12,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණත් අමාත්‍යාංශය විසින් ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කර නොතිබුණි. | සමාජ සහජීවන හා ප්‍රතිසන්ධාන ක්‍රියාකාරකම් විදේශාධාර ව්‍යාපෘතිය (SCORE) ආරම්භ කරන මුල් අවස්ථාවේදී Project Submission Form ඉදිරිපත් කර එම ව්‍යාපෘතියේ ප්‍රධාන ක්‍රියාකාරකම් සඳහා අනුමැතිය ලබා ගෙන ඇත. | ක්‍රියාකාරී සැලැස්මට අනුව ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කල යුතු වේ. |
| **ii.** ඉන්දීය රජය සමඟ පැවැති අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කරගෙන නොතිබීම නිසා යාපනය දිස්ත්‍රික්කයේ වැසි ජල පිරවුම් ටැංකි ඉදිකිරීමේ ව්‍යාපෘතිය 2020 වර්ෂයේ සිට නතර වී තිබුණත්, සමාලෝචිත වර්ෂයේ ද පද්ධති 3000 ක් ඉදිකිරීම සඳහා දේශීය අරමුදල් රු. 25,000,000 ක් ද, විදේශ මූල්‍යකරණය ආශ්‍රිත පිරිවැය යටතේ සලසා ගෙන තිබුණු රු. 3,600,000 ක් ද ප්‍රතිපාදන සම්පූර්ණයෙන්ම ඉතිරි වී තිබුණි. | ව්‍යාපෘතිය සඳහා වූ අවබෝධතා ගිවිසුමේ කාලය මේ වන විට දීර්ඝ කර ඇත. | අවබෝධතා ගිවිසුම් කාලය දීර්ඝ කර ගැනීමෙන් පසු ප්‍රතිපාදන වෙන් කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| **iii.** දිස්ත්‍රික් මට්ටමෙන් ප්‍රතිසන්ධාන කමිටු 25 ක් පිහිටුවීමට රු. මිලියන 40 ක ප්‍රතිපාදන වෙන්කර ගෙන තිබුණත්, වර්ෂය තුල කමිටු පිහිටුවීම සිදු කර නොතිබූ බැවින් සම්පූර්ණ ප්‍රතිපාදනයම ඉතිරිව තිබුණි. | රු. මිලියන 38.94 ක් රාජ්‍ය වියදම් සමාලෝචන අමාත්‍ය මණ්ඩල පත්‍රිකාව ප්‍රකාරව අවුරා තබා ඇති අතර කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් නිකුත් කරන ලද සෞඛ්‍ය මාර්ගෝපදේශ අනුව ජනතා එක් රැස් කිරීම් අවම කරන ලෙස කර තිබූ දැනුවත් කිරීම හේතුවෙන් ඉතිරි ප්‍රතිපාදනද උපයෝජනය කිරීමට නොහැකි වී ඇත. | මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව සකසුරුවම්කම හා කාර්යක්ෂමතාවය ගැන නිසි සැලකිල්ලෙන් යුක්තව මුදල් වර්ෂය තුල තම ආයතනයට ඉටු කල හැකි ශක්තිය තුල ඇස්තමේන්තු පිළියෙල කල යුතු වේ. |
| **iv. X –Press Pearl** නෞකාවෙන් සිදුව තිබූ සමුද්‍රීය ව්‍යසනය පිළිබඳව නෛතික කටයුතු සපයා තිබූ නීති සමාගම වෙත ගෙවීම් කිරීමට පරිපූරක ඇස්තමේන්තුවක් මගින් 110-1-2-26-1409 දරන වැය විෂයයට ලබා ගෙන තිබූ රු. මිලියන 9.65 ක ප්‍රතිපාදනය විදේශ විනිමය ගෙවීමට මහජන බැංකුවට කරන ලද ඉල්ලීම ප්‍රතික්ෂේප වී තිබීම නිසා සම්පූර්ණයෙන් ඉතිරි වී තිබුණි. | භාණ්ඩාගාර දෙපාර්තමේන්තුව සතුව ප්‍රමාණවත් විදේශ විනිමය නොමැති බැවින් අදාළ ඉල්ලීම ප්‍රතික්ෂේප වීම නිසා ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | නිවැරදි සැලසුමකට අනුව පරිපූරක ඇස්තමේන්තු මගින් ප්‍රතිපාදන සලසා ගත යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| **v.** | නිසි සැලසුමකින් තොරව පරිපූරක ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන සලසාගෙන තිබීම නිසා වැය විෂයයන් 03 ක ප්‍රතිපාදන සියයට 21 සිට සියයට 59 ක පරාසයක් තුල ඉතිරි වී තිබුණි. | වැය විස්තරය | ඉතිරි වීමට හේතු | කාර්යය ඉටු කිරීමේ හැකියාව මත පරිපූරක මඟින් ප්‍රතිපාදන ලබා ගත යුතු වේ. |
| | | 110-1-2-22-2104 | සේවයේ නිරතව සිටි බොහොමයක් සේවකයන් හට කොවිඩ් වැලදීම නිසා අපේක්ෂිත පරිදි කොන්ත්‍රාත්තුවේ ඉදි කිරීම් කටයුතු සිදු කිරීමට නොහැකි විය. | |
| | | 110-1-2-0-1404<br>110-1-2-23-2001 | අමාත්‍යාංශයේ සියළුම අංශ කලුතොට ගොඩනැඟිල්ලට ගෙන ඒමට සැලසුම් කර තිබුණත් උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැඟිල්ල නවීකරණය කිරීමට අදාල ගිවිසුමේ ඇතුලත් බදු කොන්දේසි පිළිබඳ ගැටළු නිරාකරණය සඳහා මුදල් අමාත්‍යාංශය විසින් සැලකිය යුතු කාලයක් ගැනීමෙන් අංශ කිහිපයක් උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ල තුලම පවත්වා ගෙන යාම හේතුවෙන් ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | |

## 2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම

---------------------------------

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | ------------------------- | ---------------------------- | -------------- |
| (අ) | බැරකම් පිළිබඳ ප්‍රකාශය **(i)** (සටහන **iv**) හි දක්වා තිබුණු එකතුව රු.1,498,440 ක් වූ බැරකම්, භාණ්ඩාගාරයේ බැඳීම් හා බැරකම් පිළිබඳ වාර්තාවට (**SA** 92) ඇතුලත් කර නොතිබුණි. | භාණ්ඩාගාර බැඳීම් හා බැරකම් ප්‍රකාශයේ ඇත්තේ අනෙකුත් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂයට ගිණුම්ගත කරන ලද බැඳීම් හා බැරකම් ය. | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති |

| | | | |
|---|---|---|---|
| | | | ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වේ. |
| (ආ) | භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශයේ (**SA** 92) ඇතුලත් එකතුව රු.13,346,860 ක් වූ බැරකම්, බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශයට (සටහන - **III**) සහ බැරකම් පිළිබඳ ප්‍රකාශයට**(i)** **(**සටහන **iv)** ට ඇතුලත් කර නොතිබුණි. | භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශයේ ඇත්තේ අනෙකුත් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂයට ගිණුම්ගත කරන ලද බැදීම් හා බැරකම් ය. එම නිසා එය සටහන III ට ඇතුලත් කර නොමැත. | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ 3.2 ඡේදය අනුව මූල්‍ය ප්‍රකාශනවල දක්වා ඇති සංඛ්‍යා අවසාන භාණ්ඩාගාර ගිණුම් ප්‍රකාශවල දක්වා ඇති ශේෂයන් සමඟ එකඟ වන බවට සහතික විය යුතු වේ. |
| (ඇ) | බැදීම් හා බැරකම් පිළිබඳ ප්‍රකාශය (සටහන **III**) ට ඇතුලත් කල යුතු එකතුව රු.741,570 ක් වූ වැය විෂයයන් 05 ක බැරකම්, මුදල් රෙගුලාසි 94 (2) සහ (3) ප්‍රකාරව එළෙඹන ලද බැරකම් පිළිබඳ ප්‍රකාශයට (සටහන**iv)** ඇතුලත් කර තිබුණි. | භාණ්ඩාගාර බැදීම් හා බැරකම් ප්‍රකාශයේ ඇත්තේ අනෙකුත් දෙපාර්තමේන්තු, දිස්ත්‍රික් ලේකම් කාර්යාල විසින් මෙම අමාත්‍යාංශ වැය ශීර්ෂයට ගිණුම්ගත කරන ලද බැදීම් හා බැරකම් ය. එම නිසා එය සටහන III ට ඇතුලත් කර නොමැත. | තොරතුරු නිවැරදිව මූල්‍ය ප්‍රකාශනවලට ඇතුලත් කල යුතු වේ. |

**2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම**

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| නිරීක්ෂණය | | | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| **නීති, රීති හා රෙගුලාසිවලට යොමුව** | **වටිනාකම** | **අනුකූල නොවීම** | | |
| | **රු.** | | | |
| (අ) **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය** | | | | |
| **i.** මුදල් රෙගුලාසි 94 (1) | 58,350 | වාර්ෂික ඇස්තමේන්තුවල මුදල් ප්‍රතිපාදන ඇත්නම් විනා වැඩක් හෝ සේවයක් හෝ සැපයුමක් සඳහා කිසිම | ඉදිරියේදී බැරකම් ඇති කර ගැනීමේදී මු.රෙ. ප්‍රකාරව අවශ්‍ය ක්‍රියා මාර්ග ගන්නා ලෙස අදාල | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | | වියදමකට හෝ බැඳීමකට හෝ නොබැඳී සිටිය යුතු වුවත්, වැය විෂයයන් 02 ක් වෙනුවෙන් වර්ෂයේ ප්‍රතිපාදන ඉතිරිය ඉක්මවා බැරකම්වලට බැඳී තිබුණි. | නිලධාරීන්ට උපදෙස් ලබා දෙන ලදි. | යුතු වේ. |
| **ii.** | මුදල් රෙගුලාසි 109 (1) හා (2) | 47,650 | 2012 සිට 2021 නොවැම්බර් දක්වා අවස්ථා 08 කදී සිදු වී තිබුණු අලාභ හා හානි සම්බන්ධයෙන් 2021 දෙසැම්බර් 31 දින වන විටත් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | වාහන අනතුරු 03 සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 104 පරීක්ෂණ සිදු වෙමින් පවතින අතර අනෙකුත් අලාභ සම්බන්ධයෙන් අලාභ කපා හැරීම හා අලාභ අයකර ගැනීම සිදු කෙරෙමින් පවතී. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| iii. | මුදල් රෙගුලාසි 365 (3) | 833,699 | අග්‍රිමයන්ට අයත් මුදල් එයට නියමිත මුදල් වර්ෂයෙන් අන්‍ය වූ මුදල් වර්ෂයක ගෙවීම් පියවීම් සඳහා යොදා නොගත යුතු බව දක්වා තිබුණත් 2022 වර්ෂයට අදාල වරිපනම් බදු රු. 833,699 ක් 2021 වර්ෂයේ ප්‍රතිපාදනවලින් ගෙවා තිබුණි. | ඉදිරියේදී එවැනි ගෙවීම් සිදු නොකිරීමට කටයුතු කරන ලෙස නිලධාරින්ට උපදෙස් දෙන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| iv. | මුදල් රෙගුලාසි 371 (2) (ආ) | 46,400 | තත්කාර්ය අතුරු අග්‍රිමය, ලබා ගන්නා කාර්යය නිමකල විගසම පියවිය යුතු වුවත්, අත්තිකාරම් මුදල ලබාගත් කාර්යය අවලංගු වු අවස්ථාවල සම්පූර්ණ අත්තිකාරම් මුදල පියවීමේ දී අවස්ථා 06 කදී වැඩකරන දින 10 සිට මාස 07 දක්වා කාලයක් මුදල් අත රඳවාගෙන තිබුණි. | අදාල කාර්යය නිම වූ වහාම ලබා ගත් අග්‍රිම මුදලට අදාල පියවීම් සිදු කරන ලෙස සියළුම මාණ්ඩලික නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කරන ලදි. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| v. | මුදල් රෙගුලාසි 835 (3) | - | අමාත්‍යාංශය කුලී පදනම මත ලබාගෙන තිබූ කිසිඳු ගොඩනැගිල්ලක ගිවිසුම් පිටපත් විගණකාධිපති වෙත එවා නොතිබුණි. | අදාල ගිවිසුම් වල පිටපත් විගණකාධිපති වෙත ලබා දීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | | | |
|---|---|---|---|---|
| (ආ) | 2016 අගොස්තු 03 දිනැති අංක 250/2016 (1) දරන රාජ්‍ය මුදල් අමාත්‍යාංශයේ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය | 15,021,830 | ගෙවනු ලබන එක් එක් අත්තිකාරම් වෙනුවෙන් ප්‍රධාන ලෙජර ගිණුම් යටතේ වෙනම ගිණුම් අංකයක් රාජ්‍ය ගිණුම් දෙපාර්තමේන්තුවෙන් ලබා ගෙන නොතිබුණු බැවින් සමාලෝචිත වර්ෂයේ අවසානයට තවදුරටත් අයවිය යුතු රු.1,722,500 ක කුලී අත්තිකාරම් ශේෂය හා සමාලෝචිත වර්ෂයේ දී ගෙවා තිබූ රු.13,299,330 ක වැඩ අත්තිකාරම්,කුලී හා වැඩ අත්තිකාරම් ගිණුමේ හෙළිදරව් කර නොතිබුණි. | මෙම ගෙවීම් සිදු කර ඇත්තේ 2509-8 හා 2001 වැය විෂයන්ගෙන් බැවින් අත්තිකාරම් ගිණුම් අංක ලබා ගැනීමේ හැකියාවක් නොමැත. එබැවින් අය විය යුතු මෙම අත්තිකාරම් ශේෂයන් කුලි හා වැඩ අත්තිකාරම් ගිණුමේ පෙන්නුම් කර නොමැත. | චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

**2.4** තැන්පත් ශේෂ

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2018 හා 2019 වර්ෂවල කොන්ත්‍රාත් සඳහා ගෙවීම් කිරීමේ දී රැඳවුම් මුදල් ලෙස ලබා ගෙන තිබුණු එකතුව රු.518,178ක් 2021 දෙසැම්බර් 31 දින වන විටත් නිරවුල් කර නොතිබුණි. | මෙම රුඳවුම් මුදල නිදහස් කිරීම සඳහා තාක්ෂණික නිලධාරින්ගෙන් නිර්දේශ ඉල්ලා ඇත. | කොන්ත්‍රාත් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |
| (ආ) | 2016 නොවැම්බර් මාසයේ පැවැති සමථ දිනය වෙනුවෙන් දරන ලද වියදම් පියවීම සඳහා UNDP ව්‍යාපෘතියෙන් 2017 මාර්තු 22 දින ලැබී තිබුණු රු.1,316,041 ක මුදල් අදාල අරමුණට වියදම් නොකර 2022 අප්‍රේල් 29 දිනය වන විටත් තැන්පත් ගිණුමේ රඳවාගෙන තිබුණි. | මෙම වර්ෂයේ සමථකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා උපයෝජනය කිරීමට අවශ්‍ය කටයුතු කරනු ලැබේ. | ලැබුණු මුදල් අදාල කාර්යයට යෙදවිය යුතු අතර එසේ නොවේ නම් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 සැලසුම් කිරීම

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2020 අගෝස්තු 28 දිනැති අංක 02/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 03 ඡේදය ප්‍රකාරව වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කිරීම පිළිබඳ මාර්ගෝපදේශ අංක 12 න් අවධාරණය කර තිබුණ ද 2021 වර්ෂය සඳහා පිළියෙල කර තිබුණු ක්‍රියාකාරී සැලැස්මට අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්මේ වගකීම් ක්ෂේත්‍රය, ක්‍රියාකාරකම් සහ ප්‍රතිඵලය, වාර්ෂික ක්‍රියාකාරකම් සඳහා වන අක්මුදල් අවශ්‍යතා සැලැස්ම,සැලසුම් කර ඇති ප්‍රධාන සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් වන වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම අන්තර්ගත කර නොතිබුණි | 2015.09.22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ අනුව ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශය මගින් නිකුත් කල අංක MNPEA/APG/15 දරණ මාර්ගෝපදේශයේ උපදෙස් අනුව 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම සකස් කර ඇත. | චක්‍රලේඛය අනුව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කල යුතු වේ. |

### 3.2 කාර්යසාධන දර්ශකවලට ලඟාවීමේ ප්‍රගතිය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| ඉදිරිපත් කරතිබූ කෙටුම්පත් කාර්යසාධන වාර්තාව අනුව අමාත්‍යාංශය විසින් ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව කාර්යසාධන දර්ශක 07 ක් හඳුනාගෙන තිබුණත්, එයින් දර්ශක 04 ක් සඳහා වූ 2021 වර්ෂයේ ඉලක්ක සපුරා ගෙන නොතිබුණි. | COVID 19 වසංගත තත්වය හේතුවෙන් කාර්යාලයෙහි කටයුතු අඛණ්ඩව සිදු කිරීමට බාධා පැමිණීම, නීති සංශෝධන සිදු කිරීමේ දි ඒ පිළිබඳව උනන්දුවක් දක්වන පාර්ශවයන්ගේ විවිධ නිරීක්ෂණ ඉදිරිපත් වීම මත නීති කෙටුම්පත් නැවත සාකච්ඡාවට භාජනය කොට සංශෝධනය කිරීම, අමාත්‍ය මණ්ඩල අනුමැතින් ලබා ගැනීමට යම් අවස්ථාවන්හි දී කල්ගත වීම සහ පාර්ලිමේන්තුවේ වාර අවසන් කිරීම,අධිකරණයේ පවතින නඩු අවසන් වන තුරු අපරාධයක වින්දිතයන් සහ සාක්ෂිකරුවන් ආරක්ෂා කිරීමේ ජාතික අධිකාරියට ඉලක්ක හඳුනා ගත නොහැකි වීම,කොවිඩ් 19 වසංගතය නිසා පුද්ගල ඒකරාශි විම් සීමා කොට තිබූ | තාත්වික හා ප්‍රායෝගික කාර්යසාධන ඉලක්ක සැලසුම් කර ඒවා සපුරා ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| | බැවින් ආයතනය තුළ මෙන්ම කලාපවල පැවැත්වීමට සැලසුම් කළ පුහුණු වැඩසටහන් පැවැත්වීමට නොහැකිවීම නිසා මෙසේ සිදු විය. | |

**3.3 ව්‍යාපෘති නිම නොකර අත්හැර දැමීම**

-----------------------------------------

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| මහල් 02 කින් යුතුව පුත්තලම නීති ආධාර හා ප්‍රජා විශෝධන ගොඩනැගිල්ල ඉදිකිරීමේ කර්මාන්තය 2010 සැප්තැම්බර් 15 දින බාහිර පාර්ශවයකට රු.5,583,770 ක කොන්ත්‍රාත්තු වටිනාකමට පිරිනමා තිබුණු අතර 2011 මාර්තු 27 දින වැඩ අවසන් කල යුතුව තිබුණි. කොන්ත්‍රාත්තුව සඳහා 2014 වර්ෂයේ දී ද වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු. මිලියන 5 ක් වෙන්කර තිබුණත් එම ප්‍රතිපාදන උපයෝජනය කර නොතිබුණි. ව්‍යාපෘතියේ වැඩ අවසන් නොකර බිම් මහල පමණක් ඉදිකර තිබූ ගොඩනැගිල්ලේ නීති ආධාර කාර්යාලය පවත්වාගෙන යනු ලබන අතර මේ හේතුවෙන් ප්‍රජා විශෝධන වරදකරුවන් උපදේශයනට ලක් කිරීම හා කාර්යාල කටයුතු කිරීම සඳහා වෙනම කාර්යාලයක් ස්ථාපිත කිරීමේ අවශ්‍යතාවය 2022 මැයි දක්වා ඉටු වී නොතිබුණි. තවද එම කොන්ත්‍රාත්කරුට 2010 ඔක්තෝබර් 21 දිනැතිව ගෙවා තිබුණු වැඩ ඇරඹීමේ අත්තිකාරම් මුදලින් රු.254,691 ක් ද, කාර්යසාධන ඇපකරයෙන් අයවිය යුතු රු.339,535 ක් ද වශයෙන් එකතුව රු.594,286 ක් 2021 දෙසැම්බර් 31 දිනට අයකර ගෙන නොතිබුණි. | තවදුරටත් අයකර ගත යුතු මුදල් අයකර ගැනීම සඳහා කොන්ත්‍රාත් ආයතනය වෙත 2022.04.26 දිනැතිව ලිපියක් සහ 2022.05.26 දිනැතිව සිහිකැඳවීම් ලිපියක් ඉදිරිපත් කර ඇත.එම ලිපි සඳහා කොන්ත්‍රාත් ආයතනය කටයුතු නොකරන්නේනම් නීතිපති දෙපාර්තමේන්තුව වෙත දන්වා යවා එහිදී ලැබෙන උපදෙස් ප්‍රකාරව ඉදිරි කටයුතු සිදු කරනු ලැබේ. | ඉදිකිරීමේ අරමුණු ඉටුකර ගත යුතු අතර අයකර ගත යුතු මුදල් අයකර ගැනීමට කටයුතු කල යුතු වේ. |

**3.4 ප්‍රධාන කාර්යයන්ට පටහැනි ක්‍රියාකාරකම්**

-----------------------------------------

| විගණන නිරික්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන්ට අදාල නොවන ව්‍යාපෘතියක් වන කොළඹ සහ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථාන සම්බන්ධ කරමින් යාපනයේ නවීන විශේෂිත ආර්ථික මධ්‍යස්ථානයක් ඉදිකිරීම සඳහා සමාලෝචිත වර්ෂයේ 110 – 1 – 05 – 22 – 2509 යන වැය විෂයයට වාර්ෂික ඇස්තමේන්තුවෙන් රු.20,000,000 ක ප්‍රතිපාදන සලසා ගෙන තිබුණු අතර එය ප්‍රයෝජනයට ගෙන නොතිබුණි. | මෙම ඉදි කිරීමේ ව්‍යාපෘතිය කෘෂිකර්ම අමාත්‍යාංශය වෙත 2020 දෙසැම්බර් මාසයේදී භාර දී ඇත. එහෙත් 2021 වර්ෂයට අදාළව අයවැය ඇස්තමේන්තු සකස් කිරීම 2020 සැප්තැම්බර් මාසයේදී සිදු කර ඇති නිසා එම ව්‍යාපෘතිය සඳහා ද 2021 වර්ෂයට ප්‍රතිපාදන වෙන් කර ඇත. | අමාත්‍යාංශයේ අරමුණු හා කාර්යයන්වලට අදාලව ඇස්තමේන්තු මඟින් ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතු වේ. |

3.5 **අපේක්ෂිත ප්‍රතිලාභ ලබා නොගැනීම**

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | අමාත්‍ය මණ්ඩල ලේකම්ගේ අංක 20/1252/330/001 – 1 හා 2020 සැප්තැම්බර් 10 දිනැති කැබිනට් තීරණ දැනුම්දීමේ ලිපියෙන් ගරු මුදල් අමාත්‍යවරයා විසින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සම්පූර්ණ කිරීමට නිශ්චිත කාල රාමුවක් හඳුනාගැනීම සුදුසු බවට යෝජනා කර, එම වියදම් වෙනුවෙන් රු. මිලියන 100 ක් අනුමත කර තිබුණි. විගණන දිනය වූ 2021 දෙසැම්බර් 27 වන විටත් කාලරාමුවක් සැකසීම හෝ වියදම් සඳහා ඇස්තමේන්තුවක් සැකසීම සිදුකර නොතිබුණු අතර 2020,2021 හා 2022 වාර්ෂික ඇස්තමේන්තුවලින් පිලිවෙලින් රු.මිලියන 50,100 හා 08 ක් වශයෙන් එකතුව රු. මිලියන 158 ක් ප්‍රතිපාදන සලසා ගෙන තිබුණි. එම ප්‍රතිපාදනවලින් 2020 හා 2021 වර්ෂවල පිළිවෙලින් රු.41,093,108 ක් හා රු.88,063,094 ක් හෙවත් සියයට 82 ක් හා සියයට 88 ක් ඉතිරි වී තිබුණි. | විශේෂඥ කමිටුවේ සාමාජිකයින් 05 දෙනෙකු කිසිඳු දීමනාවක් ලබා නොගෙන සේවය කිරීම, මූලිකව හඳුනාගෙන වෙන් කරන ලද කාර්යාල පහසුකම් Covid-19 වසංගත තත්ත්වය හේතුවෙන් 2020.12.31 දිනෙන් ඔබ්බට භාවිත නොකිරීම, මාර්ගගත රැස්වීම් පැවැත්වීම හේතුවෙන් වියදම් රැසක් ඉතිරි වීම, මෙම සංකීර්ණ ක්‍රියාවලිය සඳහා වන වියදම් නිශ්චිතව පුරෝකථනය කිරීම අපහසු වීම වැනි හේතු මත ප්‍රතිපාදන ඉතිරි වී ඇත. | කැබිනට් තීරණය පරිදි කටයුතු සිදු කල යුතු අතර නිසි සැලකිල්ලෙන් හා සකසුරුවම්භාවයෙන් යුතුව අදාල කාර්ය සඳහා වියදම් ඇස්තමේන්තු සකස් කර ප්‍රතිපාදන වෙන්කර ගත යුතු වේ. |
| (ආ) | කමිටුවේ ආරම්භක රැස්වීම 2020 ඔක්තෝබර් 09 දින ද, එදින සිට 2021 දෙසැම්බර් 12 දින දක්වා කමිටු රැස්වීම් වාර 38 ක් ද, බාහිර පාර්ශවයන් සමඟ රැස්වීම් වාර 09 ක් ද පවත්වා එකතුව රු.20,843,798 ක වියදම් දරා තිබුණි. අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ අත්සන, දිනය හා ලිපි අංකය රහිතව ඉදිරිපත් කර තිබූ කමිටු නියමයන් හි **(TRO)** කමිටුව පත්කල දින සිට මාස 06 ක් ඇතුලත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව කෙටුම්පත් කර ඉදිරිපත් කිරීමේ ක්‍රියාවලිය සම්පූර්ණ කල යුතු බව හා අවශ්‍යතාවය පරිදි ඉල්ලීම මත තවදුරටත් කාලය දීර්ඝ කලහැකි බව දක්වා තිබුණ ද 2021 දෙසැම්බර් 31 දිනට කමිටුව පත්කර මාස 15 ක් ගත වී තිබුණත්, එහි කාර්යභාරය අවසන් කර නොතිබුණි. | නව ව්‍යවස්ථාවක් සම්පාදනයට අදාළ නිර්දේශ සැකසීම ඉතා සංකීර්ණ ක්‍රියාවලියක් වන අතර, විවිධ පාර්ශවයන්හි අදහස් හා යෝජනා ලබා ගැනීම හා සමාලෝචනය කිරීම සිදු කළ යුතු වේ. සාමාජිකයින් පූර්ණකාලීන සේවය සපයනු ලබන නිලධාරීන් නොවන අතර සාමාජිකයින් 05 දෙනෙකු කිසිඳු දීමනාවක් ලබා නොගෙන සේවය කොට ඇත. එසේම, Covid-19 වසංගත තත්ත්වය හා ඊට සමගාමීව පනවන ලද සංචරණ සීමා මධ්‍යයේ කමිටුව අදාළ කාර්යභාරය ඉටු කොට ඇත. මෙම කරුණු සළකා අතිගරු ජනාධිපතිතුමා විසින් මෙම කමිටුවේ කාලසීමාව දීර්ඝ කොට ඇත. | අදාල පාර්ශවයන් සමඟ සාකච්ඡා කර නිශ්චිත කාල රාමුවක් තුල කාර්යය සිදු කර අවසන් කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | තවද ඉහත (ආ) හි ගෙවීම්වල ඇතුලත් ප්‍රයෝජනයට නොගත් කාර්යාල කාමර 3 ක් සඳහා ගෙවන ලද රු.816,480 ක කුලිය ද ප්‍රයෝජනයට නොගත් රු.435,348 ක් වටිනා කාර්යාල උපකරණ ද නිශ්ක්‍රීය වියදම් වී තිබුණි. | රට තුල ව්‍යාප්ත වූ Covid-19 වසංගත තත්ත්වය හා සංචරණ සීමා හේතුවෙන් කමිටු රැස්වීම් මාර්ගගත තාක්ෂණය හරහා සිදු කල බැවින් වෙන් කරන ලද කාමර අංක 29,30 සහ 33 නැවත භාර දෙන ලදී.<br><br>නව කාර්යමණ්ඩලය වෙනුවෙන් හා අමාත්‍යාංශයේ ඇතැම් අංශවල පැවති අඩුපාඩු සම්පූර්ණ කිරීම සඳහා මිල දී ගත් එම කාර්යාල උපකරණ යොදා ගෙන ඇත. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ආර්ථිකමය ගණුදෙනු සඳහා පමණක් මහජන මුදල් යෙදවිය යුතු වේ. |
| (ඇ) | නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම වෙනුවෙන් පිහිටුවන ලද කමිටුවේ විශේෂඥවරුන් සඳහා එක් රැස්වීම් වාරයකට සහභාගි වීම වෙනුවෙන් රු. 25,000 බැගින් රු.3,100,000 ක් ද, රැස්වීම් වාරයකට ගමන් වියදම් දීමනා වෙනුවෙන් රු.5,000 බැගින් රු.120,000 ක් ද, කමිටු ලේකම්ගේ මාසික දීමනාව රු. 200,000 බැගින් රු.1,200,000ක් ද, සම්බන්ධීකරණ මාසික දීමනාව රු. 100,000 බැගින් රු. 600,000 ක් ද, පූර්ණකාලීන පර්යේෂණ සහකාර මාසික දීමනාව රු.80,000 බැගින් රු.2,600,000 ක් ද, අර්ධකාලීන පර්යේෂණ සහකාර දීමනාව රු.40,000 බැගින් රු.2,560,000 ක් ද වශයෙන් එකතුව රු.10,180,000 ක් 2021 දෙසැම්බර් 31 දින වන විට ගෙවා තිබුණද, අදාල රේටයන් සඳහා අනුමතියක් ලබාගෙන නොතිබුණි. | නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම වෙනුවෙන් ගෙවීම් සිදු කිරීම වෙනුවෙන් ආවරණ අනුමැතියක් ලබා ගැනිමට සඳහා 2022.04.29 දිනැති අංක 2022/**cab Memo/J/R/38** දරණ කැබිනට් පත්‍රිකාව ඉදිරිපත් කර ඇත. | භාණ්ඩාගාර අනුමැතිය නොමැතිව සිදු කර තිබූ ගෙවීම් වගකිව යුතු පර්ශවයන්ගෙන් අයකර ගත යුතු වේ. |

## 3.6 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු නොකර බාහිර පාර්ශ්වයන්ගෙන් ගොඩනැගිලි 03ක් සහ බණ්ඩාරනායක ජාත්‍යන්තර අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවෙන් කාමර 06 ක් ලබා ගෙන පිලිවෙලින් රු.88,436,100 ක් හා රු.4,768,200 ක් කුලී වශයෙන් ගෙවා තිබුණි. | අංක 130, හල්ෆ්ඩ්‍රොප් මාවත කොළඹ 12, ලිපිනයේ පිහිටි ගොඩනැගිල්ල හා අංක 150, මිහිඳු මාවතේ කොළඹ 12, පිහිටි ගොඩනැගිලි 02 කුලී පදනම මත ලබා ගැනීමේ දී ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ප්‍රකාරව කටයුතු කර ඇත. අංක | 2006 ජනවාරි 25 දිනැති ජා.ප්‍ර.නි චක්‍රලේඛ ප්‍රකාරව කටයුතු කල යුතු වේ. |

| | | |
|---|---|---|
| | 19 සංඝරාජමාවත, කොළඹ 10 ලිපිනයේ ගොඩනැගිල්ලට අංක අමප/21/0842/330/004 – 1 දරන අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් අනුමැතිය ලබා ගැනීමට කටයුතු කර ඇත. ප්‍රසම්පාදන කමිටු අනුමැතිය ලබා ගෙන බණ්ඩාරනායක අනුස්මරණ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාවේ කාමර 06ක් කුලියට ගැනීමට කටයුතු කරන ලදි. | |

**3.7 වත්කම් කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අධිකරණ අමාත්‍යාංශය විසින් 2007 -2010 වර්ෂවල රු.374,119,204 ක වියදමක් දරා ඉදිකර තිබූ නීති කෙටුම්පත් සම්පාදක දෙපාර්තමේන්තුව පිහිටි ගොඩනැගිල්ල අයත් ඉඩමේ පිඹුරු පිටපත ලබා ගෙන ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර ගෙන නොතිබුණි. | පිඹුරුපත ලැබීමෙන් අනතුරුව පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරනු ලැබේ | නීත්‍යානුකූල ලියවිලි ලබාගත යුතු වේ. |
| (ආ) අධිකරණ අමාත්‍යාංශය විසින් භුක්ති විඳින නුවරඑළිය සංචාරක බංගලාව පිහිටි හෙක්ටයාර් 0.2023 ක් වූ ඉඩම, රක්වාන සංචාරක බංගලාව පිහිටි රූඩ් 01 පර්චස් 10 ක් වූ ඉඩම සහ බත්තරමුල්ල ළමා මහේස්ත්‍රාත් අධිකරණය පිහිටි හෙක්ටයාර් 0.1760 ක් වූ ඉඩම පවරා ගැනීමේ කටයුතු අවසන් කර නොතිබූ අතර වටිනාකම් තක්සේරු කර ගෙන ද නොතිබුණි. | ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදු කෙරෙමින් පවතින අතර එම කටයුතු අවසන් වූ පසුව තක්සේරුව සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | නීත්‍යානුකූල ලියවිලි ලබා ගැනීමට හා වටිනාකම තක්සේරු කර ගැනීම කල යුතු වේ. |
| (ඇ)කොළඹ නව අධිකරණ පියස ඉදිකිරීම සඳහා බී.සී.සී ලංකා ලිමිටඩ් ආයතනය සතු හෙක්ටයාර් 2.4281 ක ඉඩමේ භුක්තිය 2019 වර්ෂයේ භාරගෙන ඉදිකිරීම් කටයුතු ආරම්භ කර තිබුණත් 2021 දෙසැම්බර් 31 දින වන විටත් ඉඩමේ තක්සේරු වාර්තාව ලබා ගෙන නොතිබුණි. | ප්‍රාදේශීය ලේකම් විසින් ඉඩම අත්පත් කර ගැනීමේ කටයුතු සිදු කරමින් පවතින අතර අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව ඉඩම පවරාදීමෙන් පසු තක්සේරුව සඳහා යොමු කිරීමට කටයුතු කරනු ලැබේ. | ඉඩමේ අයිතිය කඩිනමින් ලබා ගෙන තක්සේරු වාර්තාව ලබා ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඈ) අමාත්‍යාංශයේ ප්‍රයෝජනය සඳහා වෙනත් ආයතනවලින් ලබාගෙන තිබුණු වාහන 07 ක අයිතිය 2022 පෙබරවාරි 28 දින වන විටත් පවරා ගෙන නොතිබුණි. | නීතිපති දෙපාර්තමේන්තුවෙන් ලබා දී තිබූ වාහන 04 අධිකරණ අමාත්‍යාංශ ලේකම්ගේ නමින් පවරා ගැනීමට නීතිපතිගේ විරෝධතාවයක් නොමැති බවට වන ලිපි ලබා ගැනීමටත්, අනෙක් වාහන 03 හි ලියාපදිංචි සහතිකවල මුල් පිටපත් එවකට පැවති බන්ධනාගාර පුනරුත්ථාපන හා සිරකරුවන් කළමනාකරණ රාජ්‍ය අමාත්‍යශයෙන් ගෙන්වා ගැනීමටත් කටයුතු කරමින් පවතී. | අමාත්‍යාංශය වෙත අයිතිය පවරා ගත යුතු වේ. |
| (ඉ) නියෝජ්‍ය ඇමැතිවරයාගේ රාජකාරි කටයුතු සඳහා භාර දී තිබූ රු.5,000,000 ක පමණ වෙළඳපල වටිනාකමක් ඇති කැබ් රථයක් 2017 මාර්තු 08 දින අනතුරකට පත් වී තිබුණු අතර එදින සිට බාහිර ස්ථානයක රඳවාගෙන තිබී වසර 02, මාස 06, දින 20 (දින 930) කට පසු වෙනත් වාහනයක පටවාගෙන අධිකරණ අමාත්‍යාංශ භූමියට 2019 සැප්තැම්බර් 28 දින ගෙනවිත් දමා තිබුණි. නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධූර කාලය 2018 ඔක්තෝබර් 27 දිනෙන් අවසන් වී තිබුණ ද, එම කාලයේ දී වාහනය විධිමත්ව භාර ගැනීමට අපොහොසත් වී තිබුණි. අනතුර සම්බන්ධයෙන් 2017 ජුනි 07 දින පත් කරන ලද පරීක්ෂණ මණ්ඩලයේ වාර්තාව, පොලිසියට කළ පැමිණිල්ලේ පිටපත, රියදුරුගේ ප්‍රකාශය ගොනුවේ නොතිබුණි. නැවත 2021 වර්ෂයේ මුදල් රෙගුලාසි 104 අනුව පරීක්ෂාවක් කෙරෙමින් පැවතියත් 2022 මැයි වන විටත් අනතුරට වගකිව යුතු පාර්ශවය හඳුනාගෙන රජයට සිදු වී තිබෙන අලාභය අයකර ගැනීම හෝ නෛතිකව ක්‍රියාමාර්ග ගැනීම සිදුකර නොතිබුණි. | මු.රෙ.104 විමර්ශණ මණ්ඩලය නැවත පත් කිරීමට කටයුතු කරන ලද අතර එම මණ්ඩලය මඟින් අතුරු වාර්තාවක් ඉදිරිපත් කර ඇත. ඒ අනුව මෙම රථයේ අනතුරෙන් පසු ශ්‍රේෂ්ඨාධිකරණ සංකීර්ණයට ගෙනැවිත් ඇති දින වකවානු පිළිබඳ දැනුම් දෙන ලෙස උපරිමාධිකරණ සංකීර්ණ කළමනාකරණ මණ්ඩලයේ ප්‍රධාන ආරක්ෂක නිලධාරී වෙත දන්වා ඇත. අනතුර සිදුවන අවස්ථාවේදී රථය පදවන ලද සහ රථය ඒ වන විට විධිමත් පරිදි භාර දී තිබූ පුද්ගලයන් හට ප්‍රකාශ සටහන් ලබා දෙන ලෙස දන්වා යවා ඇත. | කඩිනමින් පරීක්ෂණ අවසන් කර අලාභයන් අයකර ගත යුතු වේ. |

**3.8 අනාර්ථික ගනුදෙනු**

----------------------

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) අමාත්‍යාංශයේ කාර්යාල පවත්වාගෙන යාම සඳහා 2021 ජනවාරි 20 සිට වර්ෂ 03 ක කෙටි කාලයකට කුලී පදනම මත ලබා ගෙන තිබුණු බිම සිමෙන්ති අතුරා නොතිබූ ගොඩනැගිලි 2 හි පළමු හා දෙවන මහල් වල වර්ග අඩි 41,635 ක ප්‍රමාණයක නූල් මිශ්‍ර කාපට් ඇතිරීම වෙනුවෙන් | කුලී පදනම මත ලබා ගත් කළුතොට ගොඩනැගිල්ල තුළ අමාත්‍යාංශය පවත්වා ගෙන යාමේ අවශ්‍යතාවය නිසා පොළොව සිමෙන්ති දමා සකස් කිරීමට ප්‍රමාණවත් කාලයක් | ඵලදායී කාර්යයන් සඳහා ආර්ථිකබව සහ සකසුරුවම්කම ගැන නිසි සැලකිල්ලෙන් වියදම් කලමනාකරණය කර ගත යුතු වේ. |

| | | |
|---|---|---|
| රු.6,567,713 ක් ගෙවා තිබුණි. එහිදී අභ්‍යන්තර කාර්යාල පරිශ්‍රවලින් පිටත පිහිටි පදික මංතීරුවල, ජලය භාවිතා කරන ස්ථාන, සනීපාරක්ෂක ස්ථාන සහ ආහාර ලබා ගන්නා ස්ථානවල ද කාපට් අතුරා තිබීම නිසා කාපට් ඇතිරීමට අත්‍යාවශ්‍ය ස්ථාන හඳුනාගැනීමක් කර නොතිබුණි. | නොමැති වීම හේතුවෙන් කාපට් ඇතිරීමට සිදු වී ඇත. | |
| (ආ) අමාත්‍යාංශය යටතේ ස්ථාපනය කර තිබූ විශේෂ ඒකකයේ කාර්යාලය පවත්වා ගෙන යාම වෙනුවෙන් බව අමාත්‍ය මණ්ඩල සංදේශයේ සඳහන් කර අමාත්‍ය මණ්ඩල අනුමතිය ලබා ගෙන 2021 ජනවාරි 01 දින කුලියට ගෙන තිබූ 'දවස' ගොඩනැගිල්ලෙහි 2021 මාර්තු දක්වා අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන ඒකකය ස්ථාපිත කර තිබුණි. පසුව 2021 අප්‍රේල් සිට 2021 දෙසැම්බර් 31 දින දක්වා මාස 09 ක කාලයක් ගොඩනැගිල්ල නිශ්කාර්යව තබා ගෙන කුලිය ලෙස රු. 2,385,000 ක් ගෙවා තිබුණි. | අමාත්‍යාංශය යටතේ ස්ථාපිත කර තිබූ විශේෂ ඒකකයේ කාර්යාලය පවත්වා ගෙන යාම වෙනුවෙන් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා ගෙන අධිකරණ ස්වයංක්‍රියකරණ ව්‍යාපෘතියේ කාර්යාලය ස්ථාපිත කිරීමට තීරණය කරන ලදි. අවස්ථානෝචිතව විවිධ අවශ්‍යතා සඳහා එම ගොඩනැගිල්ල භාවිත කරන ලදි. | අවශ්‍යතාවය හඳුනාගෙන ගොඩනැගිලි කුලියට ගත යුතු වේ. |
| (ඇ) උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු සිදු කිරීමට නියමිත බව සඳහන් කර හල්ෆ්ඩෝප් මාවතේ, අංක 130 දරන ගොඩනැගිල්ල, 2021 ජූලි 12 සිට 2021 දෙසැම්බර් 31 දක්වා කාලයට රු. 900,000 ක මාසික කුලියක් ගෙවීමේ පදනම මත කුලියට ලබාගෙන තිබුණත්, 2021 දෙසැම්බර් වන විටත් උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ අලුත්වැඩියා කටයුතු ආරම්භ කර නොතිබීම නිසා ගෙවන ලද රු. 5,070,000 කුලී මුදල අනාර්ථික වියදමක් වී තිබුණි. තවද, 2021 දෙසැම්බර් වන විටත් අමාත්‍යාංශයේ රියදුරු මහතුන් උපරිමාධිකරණ සංකීර්ණ ගොඩනැගිල්ලේ නේවාසිකව රැඳී සිටින බැවින් උපරිමාධිකරණ සංකීර්ණ කලමනාකරණ මණ්ඩලයේ ආරක්ෂක හා ඉංජිනේරු අංශයේ සේවක මහතුන්ට ද එහි නේවාසික පහසුකම් ලබා දීමට තිබූ හැකියාව සම්බන්ධයෙන් අවධානය යොමු නොකර මෙම ගොඩනැගිල්ල කුලියට ගෙන තිබුණි. | කුලියට ගත් ගොඩනැගිල්ලේ ආරක්ෂක හා ඉංජිනේරු අංශයේ සේවක මහත්වරුන් සඳහා නවාතැන් සැපයීම, පුස්තකාලය ස්ථාපිත කිරීම, අධිකරණමය නොවන නිලධාරීන් පුහුණු කිරීමේ ආයතනය ස්ථාපිත කරන ලදි .එසේම උපරිමාධිකරණ සංකීර්ණයට අයත් ආරක්ෂක අංශයේ සහ ඉංජිනේරු අංශයේ සේවක මහත්වරුන් සඳහාද නවාතැන් පහසුකම් ලබා දීම සිදු කර ගොඩනැගිල්ලේ සියළු ඉඩ ප්‍රමාණයන් පූර්ණ උපයෝජනය කර ඇති අතර ඒ සඳහා ගෙවා ඇති රු.5,070,000 ක මුදල අනාර්ථික වියදමක් නොවන බව නිරීක්ෂණය වේ. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන වියදම් දැරිය යුතු වේ. |

| | | |
|---|---|---|
| (ඇ) ශ්‍රී ලංකා ආර්ථිකයට ඇති වී තිබෙන දැඩි අර්බුදකාරී තත්ත්වය තුල සමාලෝචිත වර්ෂය හා ඉදිරි වර්ෂවලදී රාජ්‍ය මූල්‍ය කටයුතු විධිමත්ව පවත්වාගෙන යාමේ අවශ්‍යතාවය දැඩිව පවතින අවස්ථාවකදී රාජ්‍ය වියදම් අතිශය සකසුරුවම්බවින් සිදු කල යුතු වුවත්, අමාත්‍යාංශය විසින් සිදු කර තිබූ උත්සව කටයුතු, සුළු මුදල්වලින් ආහාර ද්‍රව්‍ය හා ෆාමසි බෙහෙත් මිලදී ගැනීම, අධිකරණ සංකීර්ණ විවෘත කිරීමට දැන්වීම් පල කිරීම් හා ඒ වෙනුවෙන් ආහාර මිලදී ගැනීම්, ජංගම දුරකථනයක් මිලදී ගැනීම, අමාත්‍යවරයාගේ නිල නිවසට යන මාර්ගය කාපට් අතුරා සැකසීම හා උද්‍යාන අලංකරණය, මහානාහිමිවරු බැහැදැකීමට අටපිරිකර හා පලතුරු මිලදී ගැනීම, අලුත් අවුරුදු සුභ පැතුම්පත් මුද්‍රණය යනාදී වියදම් වෙනුවෙන් දරා තිබූ එකතුව රු.7,847,207 ක් ආර්ථිකමය නොවන ගනුදෙනු බව නිරීක්ෂණය විය. | අදහස් දක්වා නොතිබුණි | මූල්‍ය දුෂ්කරතා හමුවේ වඩාත් විචක්ෂණශීලීව කටයුතු කල යුතු වේ. |

## 3.9 කළමනාකරණ දුර්වලතා

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ)(i) | අධිකරණ අමාත්‍යාංශය නව පරිශ්‍රයක ස්ථාපිත කිරීම සඳහා කුලී පදනම මත බාහිර පාර්ශවකරුවකුගෙන් ලබාගත් ගොඩනැගිලි දෙක , වසර 15 කට පමණ පෙර ඉදිකිරීම් කටයුතු අතරමඟ අතහැර දමා භාවිතයට ගෙන නොතිබූ මහල් 11 කින් යුත් ගොඩනැගිල්ල පදිංචියට සුදුසු පරිදි ඉදිකිරීම් සිදුකර නොතිබීම නිසා රජයේ තක්සේරුව ලබා දී නොතිබුණි. එහෙත් ගොඩනැගිල්ලේ වර්ග අඩියකට පළමු වර්ෂයට රු. 130 ක් හා ඉන්පසු සෑම වර්ෂයකටම සියයට 5 ක වැඩිවීමක් සහිතව ගෙවීමට ගිවිස ගෙන 2021 දෙසැම්බර් 31 දින වන විට මාස 3 ක කුලී අත්තිකාරම්, ආරක්ෂිත තැන්පතු හා මාසික කුලිය වශයෙන් එකතුව රු. 77,801,100 ක් ගෙවා තිබුණි. එසේම මෙම ගොඩනැගිලිවලට අදාල අනුමත ගොඩනැගිලි සැලසුම්, කොළඹ මහ නගර සභාවෙන් නිකුත් කරන පදිංචියට හා භාවිතයට සුදුසු බව තහවුරු කිරීමේ සහතිකය (COC සහතිකය) සහ කාර්යාලයක් පවත්වාගෙන යාම සඳහා | ගොඩනැගිලි හිමිකරු විසින් අනුකුලතා සහතිකය ලබා ගැනීමට කටයුතු කරන බව දන්වා ඇත. ඉන්පසු තක්සේරු වාර්තාව ලබා ගැනීමට කටයුතු කරනු ලැබේ. ගොඩනැගිල්ලේ ස්ථායිතාවය පිළිබඳ සහතිකය (Stability Report) ලබාගෙන ඇත. | ගොඩනැගිලි කුලියට ගැනීමේ දී සියළුම ආකාරයෙන් පදිංචියට සුදුසු බව නිත්‍යානුකූලව සහතික කල ගොඩනැගිලි ලබා ගත යුතු අතර ගෙවීම් කිරීමේ දී රජයේ තක්සේරු වාර්තාව අනුව කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | ගොඩනැගිල්ලෙහි තත්ත්වය හා යෝග්‍යතාවය පිළිබඳව ජාතික ගොඩනැගිලි පර්යේෂණ සංවිධානයේ අනුමැතිය ලබාගෙන නොතිබුණි. | | |
| (ii) | එමෙන්ම 2021 දෙසැම්බර් 08 විගණන දිනය වන විට දෙවන ගොඩනැගිල්ලේ බිම් මහලේ වර්ග අඩි 4158 ක් ද, පළමු මහලේ වර්ග අඩි 8,477 ක ප්‍රමාණයක් ද කිසිදු ප්‍රයෝජනයට ගෙන නොතිබිය දීත් 2021 වර්ෂය සඳහා රු.21,816,210 ක් කුලී ගෙවා තිබුණු අතර බිම් මහලේ වර්ග අඩි 4158 ක සහ පළමු මහලේ වර්ග අඩි 12530ක අභ්‍යන්තර පිරිසැකසුම් කටයුතු සඳහා රු.11,067,732 ක වියදමක් ද කර තිබුණි. | ගොඩනැගිල්ල තුල විදුලිය, ජලය, අභ්‍යන්තර හා බාහිර දුරකථන ජාල, අන්තර්ජාල පහසුකම්, වායු සමීකරණ පහසුකම් ආදිය සැපයීමේ ප්‍රමාදය නිසා අභ්‍යන්තර විගණන අංශය, ලේඛණාගාරය, ගබඩා කාමරය, රියදුරු විවේකාගාරය, අමාත්‍ය හා ලේකම් කාර්යාල සහ නීති අංශය ස්ථාපිත කිරීමට ප්‍රමාද විය. | අවශ්‍යතාවය නිවැරදිව හඳුනාගෙන ගොඩනැගිලි කුලියට ලබා ගත යුතු වේ. |
| (ආ) | අමාත්‍යාංශය සහ ඒ යටතේ ඇති දෙපාර්තමේන්තු/ ආයතනවල කාර්ය මණ්ඩලයේ විනය පරීක්ෂණ කටයුතු සම්බන්ධයෙන් 2017 සිට 2021 දක්වා කාලය තුල ගොනු කර තිබූ විනය පරීක්ෂණ සංඛ්‍යාව 107 ක් වූ අතර 2022 මැයි වන විට විනය පරීක්ෂණ ගොනු 46 ක් අවසන් කර නොතිබුණි. තවද 2017 ට පෙර ගොනු කර තිබූ විනය ගොනු 17 ක් ද විය. | 2017 සිට 2021 දක්වා ගොනු කර තිබූ විනය පරීක්ෂණ 107 න් 2022 වර්ෂයේ මැයි මාසය වනවිට 61 ක් අවසන් කර ඇති අතර ඉතිරි විනය ගොනු 46 හි විනය කටයුතු සිදු කෙරෙමින් පවතී. 2017ට පෙර ගොනු කර තිබූ විනය ගොනු 21න් 17 ක් මේ වන විට ඉතිරිව ඇත. | විනය පරීක්ෂණ කටයුතු කඩිනමින් අවසන් කර අදාල විනය ක්‍රියාමාර්ග ගත යුතු වේ. |
| (ඇ) | යාපනය දිස්ත්‍රික්කයේ ක්‍රියාත්මක වන වැසි ජල ටැංකි 2889 ක් ඉදිකිරීමේ ව්‍යාපෘතියේ භෞතික ප්‍රගතිය තහවුරු කරගත නොහැකි විය. | 2020 වර්ෂයේදී ප්‍රතිසන්ධානය මූලික කරගත් ආර්ථික සවිබල ගැන්වීමේ හි සමාජ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ක්‍රියාත්මක කරන ලද ව්‍යාපෘති වල ප්‍රගති වාර්තා මේ වන විට අමාත්‍යාංශය වෙත ගෙන්වා ගැනීමට කටයුතු කර ඇත. | ක්‍රියාත්මක කරනු ලබන ව්‍යාපෘතිවල භෞතික ප්‍රගතිය කාලීනව ලබා ගත යුතු වේ. |
| (ඇ) | ජාත්‍යන්තර වාණිජ ගිවිසුම් සහ වෙනත් ජාත්‍යන්තර සබඳතා ආශ්‍රයෙන් පැන නඟින ආරවුල් නිරාකරණය සඳහා කලාපීය මධ්‍යස්ථානයක් ලෙස 2013 වර්ෂයේදී ජාත්‍යන්තර බේරුම්කරණ මධ්‍යස්ථානයක් ඇතිකර එය ස්ථිර ස්ථානයක ස්ථාපිත කරන තෙක් කුලී පදනම මත ලබාගත් ස්ථානයක පවත්වාගෙන ගොස් තිබුණු අතර 2013 ජුලි සිට 2021 දෙසැම්බර් 31 දක්වා කුලිය හා පරිපාලන වියදම් වශයෙන් එකතුව රු. 231,288,405 ක් ගෙවා තිබුණි. පසුව මෙම මධ්‍යස්ථානය 2016 දෙසැම්බර් මාසයේදී ඇපයෙන් සීමිත සමාගමක් ලෙස ස්ථාපිත | බේරුම්කරණ මධ්‍යස්ථානය වඩාත් ඵලදායීව හා අන්තර්ජාතික ප්‍රමිතීන්ට අනුව පවත්වා ගෙන යාමට නව කොළඹ වරාය හා අන්තර් සම්බන්ධතාවයන් පවත්වා ගෙන යාම සඳහා වරාය නගර ආර්ථික කොමිෂම හා එකඟතාවයකට එළඹීම සුදුසු බව යෝජනා කරන ලදි. ඒ සඳහා 2021.10.12 හා අමප/16/21/1768/390/039-1 මගින් අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබූ අවබෝධතා | මෙම පරිපාලන ගැටළුව කඩිනමින් නිරාකරණය කර පිහිටු වීමේ අරමුණ ඉටු කර ගැනීමට කටයුතු කල යුතු වේ. |

| | | | |
|---|---|---|---|
| | කර තිබූ අතර සමාගමට අවශ්‍ය මූලධනය සපයාදීම සම්බන්ධයෙන් තීරණයක් ගෙන නොමැතිවීම හා අධ්‍යක්ෂ මණ්ඩලයක් පත්කර නොමැති වීම යන හේතු නිසා එම සමාගම අක්‍රීයව පවතින බව ලිපිගොනු අනුව නිරීක්ෂණය විය. මෙ අනුව මධ්‍යස්ථානය පිහිටුවා වසර 8 ½ ක් ගත වී තිබුණත් මෙම මධ්‍යස්ථානය ස්ථිර ස්ථානයක පිහිටුවීමට අධිකරණ අමාත්‍යාංශය අපොහොසත් වී තිබුණු අතර මධ්‍යස්ථානය පිහිටුවීමේ අරමුණ ඉටුකරගෙනද නොතිබුණි. | ගිවිසුම 2021.12.27 දින අත්සන් කර ඇත. | |
| (ඉ) | වැඩ තහනමට ලක් වූ නිලධාරීන්/සේවකයින් 3 දෙනෙකුගේ ණය ශේෂ එකතුව රු.323,197 ක් වසර 9 සිට 14 දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | එක් ණයගැතියකු පිළිබඳ තොරතුරු සොයාගත නොහැකි වී ඇති අතර ඉතිරි ණය ශේෂ 2 අයකර ගැනීම සම්බන්ධයෙන් නීතිමය කටයුතු කරමින් පවතී. | ණය ශේෂ අයකර ගත යුතු වේ. |
| (ඊ) | සේවය හැර ගිය නිලධාරීන් දෙදෙනෙකුගේ එකතුව රු.238,395 ක් වූ ණය ශේෂ වසර 06 සිට 07 දක්වා කාල පරාසයක සිට අය නොවී පැවතුණි. | නීතිමය පියවර ගැනීම සඳහා අදාළ තොරතුරු නීතිපති දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇත. | ණය ශේෂ කඩිනමින් අයකර ගත යුතු වේ. |
| (උ) | රජයේ නිලධාරීන්ගේ අත්තිකාරම් “බී” ගිණුමේ වාර්ෂික සැසඳුම් ප්‍රකාශයේ සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර මුද්‍රිත අනුව තථ්‍ය ශේෂය සහ දෙපාර්තමේන්තු පොත් අනුව තථ්‍ය ශේෂය අතර රු.27,380 ක වෙනසක් ද දෙපාර්තමේන්තු පොත් සහ කේවල ණය ශේෂයන්ගේ එකතුව අතර රු.**8,415** ක වෙනසක්ද පැවතුණි. | අදහස් දක්වා නොතිබුණි | ගිණුම් ප්‍රකාශනවල නිවැරදි අගයන් දැක්විය යුතු අතර ශේෂ සසඳා වෙනස්කම් නිවැරදි කර ගත යුතු වේ. |
| (ඌ) | විශ්‍රාම ගිය නිලධාරීන් හතර දෙනෙකුගෙන් අයවිය යුතු රු.711,685 ක් සහ සේවයේ නියුතු නිලධාරීන්ගේ අයවිය යුතු රු.7,600 ක් වූ විශේෂ අත්තිකාරම් ශේෂය ණය ශේෂ එකතුවට ගෙන නොතිබුණි. | අදහස් දක්වා නොතිබුණි | නිවැරදි අගයන් දැක්විය යුතු වේ. |
| (එ) | මූල්‍ය ප්‍රකාශනවල ඇතුලත් 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වැඩසටහන් අනුව වියදම් සාරාංශයේ (ACA - 2)මුදල් රෙගුලාසි 66/69 මාරු කිරීම් රු.21,624,344 ක් දක්වා නොතිබීම නිසා එම වටිනාකමින් මුළු ශුද්ධ පුනරාවර්තන වෙන් කිරීම් වැඩියෙන් ද ප්‍රාග්ධන වෙන් කිරීම් අඩුවෙන් ද දක්වා තිබුණි. | අතපසු වීමකින් මු.රෙ 66 යටතේ මාරු කිරීම් වැඩ සටහන් අනුව වියදම් සාරාංශයේ දැක්වීමට නොහැකි වී ඇත. | නිවැරදිව මූල්‍ය ප්‍රකාශන සම්පූර්ණ කල යුතු වේ. |

**4. මානව සම්පත් කළමනාකරණය**

---

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) අමාත්‍යාංශය කාර්ය මණ්ඩලයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ නිලධාරීන් 15 දෙනෙකුගේ ද, තෘතියික මට්ටමේ නිලධාරීන් 05 දෙනෙකුගේද, ප්‍රාථමික මට්ටමේ සේවකයින් 13 දෙනෙකුගේද පුරප්පාඩු පැවතුණි. | පුරප්පාඩු සම්පූර්ණ කිරීමට කටයුතු සිදු කෙරෙමින් පවතී. | අත්‍යාවශ්‍ය තනතුරුවල පුරප්පාඩු සම්පූර්ණ කර ගත යුතු වේ. |
| (ආ)සමථ මණ්ඩල කොමිෂන් සභාවේ පරිපාලන නිලධාරී තනතුර සඳහා වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම මත බඳවාගෙන 2022 ජුනි වන විටත් සේවයේ යොදවා ගෙන තිබුණි. | රාජ්‍ය සේවා කොමිෂන් සභා ලේකම්ගේ අංක PSC/APP/HB/01/2022 හා 2022.05.25 දිනැති චක්‍රලේඛය අනුව ඉදිරි කටයුතු සිදු කිරීමට නියමිතය. | පුරප්පාඩු ස්ථිර පදනමින් සම්පූර්ණ කර ගැනීමට කටයුතු කල යුතු වේ. |
| (ඇ) නිශ්චල ඡායාරූප ශිල්පී තනතුරු 02 ක් සඳහා 2007 දෙසැම්බර් 03 දින සිට සහ 2014 ඔක්තෝබර් 24 දින සිට සේවකයින් දෙදෙනෙකු පත් කර තිබුණත්, 2022 පෙබරවාරි වන විටත් එම තනතුරු 02 සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබාගෙන නොතිබුණි. | නිශ්චල ඡායාරූප ශිල්පි තනතුරු දෙක සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා කටයුතු සිදු කෙරෙමින් පවතී. | අදාල තනතුරු සඳහා කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමැතිය ලබා ගත යුතු වේ. |
| (ඈ)අමාත්‍ය මණ්ඩල ප්‍රතිකා අංක 12/1783/518/021 න් නීති උපදේශක තනතුරට 2013 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි කොන්ත්‍රාත් පදනමින් වසරක කාලයක් සඳහා නිලධාරිනියක් පත් කිරීමට ද එම සේවා කාලය අවසන් වූ පසු සුදුසු නිලධාරියකු හඳුනාගෙන අමාත්‍ය මණ්ඩල කාර්යාලයට අනුයුක්ත කර ගැනීමට ද උපදෙස් දී තිබුණත් අමාත්‍යාංශය ඒ අනුව කටයුතු නොකර කොන්ත්‍රාත් කාලය වසරින් වසර දීර්ඝ කරමින් 2022 ඔක්තෝබර් 20 දක්වා තවදුරටත් දීර්ඝ කර ගෙන තිබුණි. | අමාත්‍යාංශයට ඉදිරිපත් වන නීති ගැටළු සහ අනෙකුත් නෛතික අවශ්‍යතා සඳහා නීති ක්ෂේත්‍රයේ අත්දැකීම් බහුල එවැනි නිලධාරිනියකගේ සේවය අත්‍යවශ්‍ය වී තිබූ බැවින් වසරින් වසර දීර්ඝ කරමින් සේවය ලබාගන්නා ලදී. | අමාත්‍ය මණ්ඩල තීරණය අනුව කටයුතු කල යුතු වේ. |
| (ඉ) විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවීමට ලබාදී තිබූ අනුමැතිය මත බඳවාගෙන සිටි අතිරේක ලේකම් (නීති) තනතුරෙහි අනුමත කොන්ත්‍රාත් කාලය අවසන් වීමෙන් පසුවද අනුමතියක් රහිතව 2021 ඔක්තෝබර් 18 සිට 2022 අප්‍රේල් 30 දක්වා සේවයේ යොදවාගෙන රු.1,166,797 ක් දීමනා ලෙස ගෙවා තිබුණි. | 2021.10.18 දින සිට 2022.04.30 දක්වා ද අතිරේක ලේකම් (නීති) තනතුරේ රාජකාරී සත්‍ය වශයෙන්ම සිදු කරන ලද බැවින් එම කාල සීමාව සඳහා කොන්ත්‍රාත් කාලය දීර්ඝ කරගැනීමට අභියාචනයක් රාජ්‍ය සේවා කොමිෂන් සභාව වෙත යොමු කර ඇත. | රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ අනුමැතිය මත පමණක් විශ්‍රාමික නිලධාරීන් කොන්ත්‍රාත් පදනම මත නැවත සේවයේ යෙදවිය යුතු වේ. |